# දහඅට වංගුව

## විභාගෙ විභාගේ.....

අපි බොහොම දෙනෙක් කලාවට ප්‍රියයි. ඒක ජනප්‍රිය හෝ ප්‍රබුද්ධ හෝ වෙන්න පුලුවන්. මොන කලාවෙන් හරි ඔලුවටයි පපුවටයි දෙකටම රසය දෙන්න පුලුවන් නම් ඒක තමයි නියම කලාව. අවාසනාවකට එහෙම දෙකම එකට දෙන්න





පුලුවන් නිර්මාණ තිබුණොත් එහෙම නිර්මාණ කරන්න පුලුවන් නිර්මාණකරුවො හිටියෙත් සංඛ්‍යාත්මකව අඩුවෙන්. රසය තිබුණොත් හරය නැහැ. හරය තිබුණොත් රසය නැහැ. මේ දෙකම සමබර තරගෙන නිර්මාණ කළ නිර්මාණකාරියක් අප අතරින් සමුගත්තා. ඇය සෝමලතා සුබසිංහ.

ඈ ගැනත් ඇගේ නිර්මාණ චාරිකාව ගැනත් මේ වන විට මාධ්‍ය හරහා බොහෝ දේ පළ වී අවසන්. ඒකට චූටි මල්ලිට වඩා බොහෝ සුදුසු කම් තියෙන කට්ටිය ඉන්නවා. ඒත් ඇගේ " විකෘති" බලපු ප්‍රේක්ෂකයෙක් විදිහට ඈ ගැන සටහනක් තබන එක යුතුකමක් ලෙස මට දැනුණා. මට ඈ ගැන ලියන්න බොහෝ දේ ඉතිරි වී නොතිබුණත් ළමා නාට්‍ය කලාවට ඈ කළ සේවයත් ළමයින් ගැන ඇගේ තිබූ සංවේදී බව කියන්න මම දන්න පුංචි කතාවක් මා ඔබට කියන්නම්. මේක මගේ හොඳ මිත්‍රයකුගේ නංගිලා දෙන්නගේ අත්දැකීමක්.

අසූව දශකයේ සුබසිංහ මහත්මියගේ විකෘති නාට්‍යයට තිබුණේ පුදුම ඉල්ලුමක්. බොහෝ තරුණ තරුණියන් නොතිත් ආශාවක් වෙලා තිබුණෙ විකෘති බලන එක. විකෘති නාට්‍යයේ එන "විභාගෙ විභාගේ.. මේක තමයි අභාගේ" ගීතය ඒ කාලේ තරුණ පරම්පරාවේ ජනප්‍රිය ගීයක් වෙලා තිබුණා. මෙන්න මේ කාලේ විකෘති කළුතර පුරහලේ දර්ශනයක් සූදානම් කරලා තිබුණා. මගේ මිත්‍රයා අද එතෙර ජීවත් වුණත් ඔවුන් සාමාන්‍ය පන්තියේ එතරම් ධනවත් අය නොවෙයි. ඔහුගේ නංගිලාට විකෘති බලන්න ඕනෙ වුණත් ටිකට් ගන්න මුදල් තිබුණේ නැහැ. ඔවුන් දෙදෙනා කතා වෙලා පොඩි උපායක් යෙදුවා. ලිව්වා අනුකම්පාව උපදන ලියුමක් සෝමලතා සුබසිංහ මහත්මියට.

අපි හුඟක් දුප්පත්. තවම සාමාන්‍ය පෙළ ඉගෙනගන්නවා. අපේ වාසගමුත් සුබසිංහ. අරකය.. මේකය.. අපට මේ නාට්‍යය බලන්න ටිකට් දෙකක් ලබා දෙන්න.... ඔබට පිං... ඔන්න ඔය වගේ අදහස් ටිකක්. මේක නිකම් පොඩි ට්‍රයි එකක්. වැඩේ කියන්නේ කලුතර දර්ශනයට දවස් දෙකකට කලින් ටිකට් දෙකක් තැපැල් මගින් නංගිලා දෙන්නට ආපු එකනේ. නංගිලා කළේ වංචාවක් බව ඇත්ත. සමහරවිට ඒක සුබසිංහ මහත්මියටත් තේරෙන්න ඇති. මොනව වුණත් ඈ ඒ ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීමයි වඩා වැදගත්. කවුරු කොහොම කළත් ප්‍රේක්ෂකයෙකුගේ ඉල්ලීමට සංවේදී වෙලා මැදිහත්වීම මොන තරම් අගය කළ යුතු දෙයක්ද? සංවේදී වීම යන්නෙහි නියම අරුත එය නොවේද? කලාකරුවො කියන්නෙ එවැනි අයට නොවේද?

සෝමලතා සුබසිංහ නිර්මාණකාරියනි ඔබට සදා සුවය පතමි.

## සමරිසි

මේ දවස්වල ඕස්ට්‍රේලියාවේ සමරිසි විවාහ අනුමැතිය ලබාදීම ගැන විවෘත කතා බහක් ඇතිවේගන යනවා. බොහෝ දෙනා ඒ කතාව ගණන් ගන්නේ නැතිව - එහෙමත් නැත්නම් නෑහුණා වගේ - ඉන්නවා වගේ පේනවා. මට නම් හිතෙන්නෙ ඒ නිහැඬියාව හොඳ ලක්ෂණයක් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක තියෙන. අපේ බොහෝ සුචරිතවාදීන් මේ වගේ මාතෘකා ගැන එළිපිට කතා කරන්න කැමති නැහැ. කතා කරන්නෙ පුද්ගලික තැන් වල විතරයි. ඒකත් රහසින් වගේ වටපිට බලලා කරන කතාවක්. චූටි මල්ලි එළිපිට කියන්නෙ උන්ට බඳින්න ඕනෙ නම් ඒකට අවසර දෙන්න ඕනෙ කියන එකයි. වැදගත් වෙන්නෙ මිනිස්සුන්ගේ පෞද්ගලික කාරණා වලට වඩා ඔහුගෙන් හෝ ඇයගෙන් හෝ සමාජයට ලැබෙන දෙයයි. පෞද්ගලික ජීවිත වල බලපෑම් සමාජය දක්වා පැතිර යාමට ඉඩකඩක් තියෙන බව ඇත්ත වුණත් ඒ නිසා මිනිසුන්ගේ මානුෂික අයිතීන්ට වැට බඳින්න දියුණු සමාජයක ඉඩක් නැහැ. ඒක තමයි මේ වෙන්නෙ.

මේ කාරණය ගැන කතාකරන හැමෝම කියන්නෙ ප්‍රශ්නයක් නැහැ.... ඒත් නිකං "ඔඩි" වගේ නේද... කියලා. චූටි මල්ලිට තියෙන ප්‍රශ්නය මොකක්ද මේකෙ තියෙන ඔඩි ගතිය කියලයි.

මිනිස්සු ගෑනු හමුවෙනවා කතා කරනවා ලව් කරනවා බඳිනවා එකට ජීවත් වෙනවා. වර්ගයා බෝ කරනවා. මෙතුවක් කාලයක් එහෙම වුණා. සමාජය අවුලක් නැතුව ඉදිරියට යනවා. ඒ වගේම මිනිස්සු මිනිස්සුත් හමුවෙනවා. ගැහැනු ගැහැනුත් හමුවෙනවා.. අදහස් ගැලපෙන එවුන් එක්වෙනවා. එකට ඉන්නවා. මෙතුවක් එහෙම වුණා. ඕන්නම් ළමයි අරගෙන හදා ගන්නවා. ඒත් සමාජය අවුලක් නැතුව ඉදිරියට යනවා. දැන් ඒ අය මේක නීතිගත කරන්න අවසර ඉල්ලනවා. ආණ්ඩුව තීරණයක් ගන්න හදනවා. දැන් ඉතින්




මේක නොදී ඉන්න තියෙන අවුල මොකක්ද? කොලේ වහලා ගහන්න ඕනෙ නැහැනෙ. ප්‍රශ්නෙ තියෙන්නෙ මේ ලිංගික කාරණාවනෙ. ඉතින් එකට ඉන්න එවුන් ඒකට කැමති නම් සමාජයට ඒකෙන් වෙන අගතියක් නැත්නම් පැත්තක ඉන්න අපට පාන්ද?

මෙහෙමනේ. මේ ප්‍රශ්නෙ දිහා අපි මීට වඩා සාධාරණ මානුෂික විදිහට බලන්න ඕනෙ නැද්ද? මේ කාරණේ ලෝකෙ අපි කාටත් ආගන්තුක එකක නොවෙයිනෙ. කොයි රටෙත් පාසල් නේවාසිකාගාරවල ඉඳලා පල්ලි පන්සල දක්වා ගැහැනු පිරිමි බේධයකින් තොරව පැවතුණ සමරිසි සේවනය ඈත අතීතයේ සිටම පැවති බව අවුරුදු දහස් ගාණකට පෙර විනාශ වුණ පොම්පෙයි නුවර නටඹුන් වලිනුත් පැහැදිළිවම පේනවා.

මිනිස්සු ගෑනු එකතුවෙලා කුටුම්භ හදන්නේ තමන්ට ගැලපෙන කෙනා සමග දිග ගමනක් යන්න පුලුවන් කියලා දැනුනමනේ. ඒ අර්ථයෙන්ම පිරිමි සමග එකතුවෙන පිරිමිත් ගැහැනු සමග එකතුවෙන ගැහැනුත් ඒ වගේමයි. ඔවුන්ටත් දැනෙනවා ඇති ඒ ඒ අය සමග දිග ගමනක් යන්න පුලුවන් කියලා. අපි තාමත් ප්‍රශ්න දිහා බලන්නෙ අපට පුරුදු සංස්කෘතික ඇහෙන්ම තමයි. ඒත් මේ වගේ රටකට ආවට පස්සෙවත් අපි විවෘත මනසකින්ුු ප්‍රශ්න දිහා බලන්න පුරුදු වෙන්න ඕනෙයි කියලයි මට හිතෙන්නෙ.

මේ කියපු දේවලින් මට අවශ්‍ය වුණේ මම මේකට පක්ෂයි කියලා කියන්න නෙවෙයි. මම කියන්නෙ අනිත් මිනිසුන්ගෙ අයිතියට බාධා නොකරන්න අපි පුරුදු වෙන්න ඕනේ කියන එකයි.

## බෙදවාචකයක්

ලංකාවේ විතරක් නෙවෙයි ඕනෑම රටක ඉඳල මෙහෙට සංක්‍රමණය වන ඕනෑම අයෙකුගෙ ඒකායන අරමුණ වන්නෙ කොහොමහරි රස් සාවක් කරලා ගෙයක් දොරක් තමන්ටම කියලා ගොඩනගාගන්නනෙ. ඒ වෙනුවෙන් අපි නොකරන දෙයක් නැහැ වගේ. පුදුම කට්ටක්නෙ කන්නෙ හෝම් ලෝන් එක ගෙවාගන්න. 90 පරම්පරාව නම් දැන් ඒක ඉටුකරගෙන ඉන්වෙස්ට්මන්ට් හොයන කාලෙ දැන් ඇවිල්ලා. අපි තාම කට්ට කන බැච් එකේ.

අපි හැමෝටම අපේ අරමුණට කොහොම හරි යන්න පුලුවන් වෙලා තියෙන්නෙ ඒ සඳහා හොඳ සිස්ටම් එකක් මෙහේ ගොඩනගල තිබුණ හන්දා වගේම අපට ඒකට සැබෑ අවශ්‍යතාවක් තියෙන නිසා. අපේ ජනගහනයෙන් ස්ථිර පදිංචි කරුවන් 75% ක් විතර තමන්ගේම නිවාස හිමිකරුවන් වෙලා ඉවරයි.

ඔබ විශ්වාස කරනවද නවතම සංඛ්‍යා ලේඛණ අනුව වික්ටෝරියාවේ විතරක් නිවාස අහිමි 35000 ක් පමණ සිටින බව. නිව්සවුත් වේල්ස් ප්‍රාන්තයේ ඒ සංඛ්‍යාව 50000 ක් ඉක්මවලා ගිහින්. අනෙක් හැම ප්‍රාන්තයකමත් 20000 කට වැඩි පිරිසක් නිවාස අහිමි අය ඉන්නනවා. ඔස්ට්‍රේලියාව වගේ පිළිගත් අධ්‍යාපන රටාවක් තියෙන කාර්මික විද්‍යාල සිට ඉහළ සරසවි දක්වා ප්‍රායෝගික පහසුකම් සපයන ආයතන තියෙන තමන් ඉගෙනගත් දෙයට ගැළපෙන රැකියා අවශ්‍යතා ඇති රටක තමන්ගේ තමන්ගේ අධ්‍යාපනය නිසි ලෙස හදාරා රැකියාවක් සොයාගෙන තමන්ටම කියලා නිවාසයක් හිමි කර ගැනීමට නොහැකිවීම නම් සෑහෙන්න බොන්න ඕනෙ ප්‍රශනයක්.

අනෙක් කාරණාව නම් නිවාස අහිමි අයගෙන් වැඩි ප්‍රමාණයක් ඕස්ට්‍රේලියානුවන් වීමයි. නිවාස අහිමි ඔසියෝ පැත්තක තියමු. තමන්ගේම නිවාසයක් අහිමි බෝට්ටුවලින් ආපු සහෝදරවරුන්ටත් වඩා අසරණ ශ්‍රී ලාංකික උපාධිධාරියෙක් රෑට නිදාගන්නේ ඩැන්ඩිනොන් මාකට් එකේ එළවලු බක්කියක කියල කිව්වොත් ඔබ විශ්වාස කරනවද?

ඔහු 457 වීසා එක යටතේ මෙහෙට ඇවිත් මාස කීපයක්. ආපු ගමන් කම්පැණියක රසසාව ලැබිලා නවාතැනකුත් ලැබිලා මාසයයි. කම්පැණිය බංකොලොත්. රස්සාවෙන් එළියට නවාතැනිනුත් දොට්ට. දන්න කියන කෙනෙකුත් නැහැ. ලංකාවට සැබෑ තත්වය කියන්නත් බැහැ. කට්ට කාගෙන ඉඳලා



එහෙන් මෙහෙන් තැන් තැන් වල පොඩි පොඩි වැඩ කරලා වේල පිරිමහගෙන රෑට මාකට් එකේ නිදාගෙන තමයි අපේ මිත්‍රයන් සෙට් එකකට හමුවෙනකල් ඔහු ඉඳලා තියෙන්නෙ. අතරමගදී හමුවන ශ්‍රී ලාංකි කයන් කීප දෙනෙකුටම තමන්ගේ සැබෑ තත්වය කිව්වත් කෑම වේලකින් එහාට ගිය උදව්වක් ලැබිලා නැහැ. ඔහුගේ වාසනාවට අපේ කට්ටිය සෙට් උනේ. අපේ උන්ගෙ පපු ඩොග් ගාලා උනුවෙන හින්දා කට්ටිය කලෙක්ෂන් එකක් දාලා ඉන්න තැනක් සෙට් කළා. පොඩි රස් සාවකුත් යන්තම් අමුණලා තියෙන්නෙ. මහත්වරුණි ඔබට අවස්ථාවක් ලැබිලා තියෙනවා සුදුසුකම් සහිත ශ්‍රී ලාංකිකයකුට පිහිට වෙන්න. එහෙම කියනවට වඩා මම කැමතියි යුතුකමක් ඉටුකරන්න අවස්ථාවක් ලැබිලා තියෙනවා කියලා කියන්න. කැමතිනම් ඒ යුතුකම සන්නස හරහා කරන්න පුලුවන්.

## සංගීත වසන්තය

මෙල්බන් වලට සංගීත වසන්තය එළැඹිලා වගෙයි. සංගීත කට්ටිය සේරම මෙහේ. ආහාරය වගේ තිබුණ සංගීතය දැන් දිරවාගන්න බැරි සයිස් එකට ඇවිල්ලා. ඇයි දෙයියනේ අපට මෙහෙම ළඟ ළඟ ලොකු ලොකු ගණන් වලට සංගීථ රසය බෙදන්නෙ? මේක නම් මාර අසාධාරණයි. රූකාන්තලා ආත්මලා දීපිකාලා නන්දක්කලා චන්ද්‍රලේඛා විතරක් නෙවෙයි ලෙලුම්ලත් මෙහේ. හෙට අනිද්දට නීලා විතරක් නෙවෙයි අමරදේව මාස්ටරුත් එනවලු. ඊළඟට සමන් ලෙනින්. කසුන් කල්හාර. දිවුල්ගනේ.

අනේ මේ ප්‍රසංග සංවිධානය කරන මහත්තුරු ඇයි අපි ගැන හිතන්නෙ නැත්තෙ. මේ විදිහට සතිපතා ප්‍රසංග වලට ගෙවන්න මුදල් අපට කොහෙන්ද? අපි මේ හැම ශිල්පියෙකුටම ආසයි. ඒ හැම ප්‍රසංගයක්ම බලන්නත් ආසයි. ඒත් අතේ මුදල් නැතිව කොහොමද මේ හැම ප්‍රසංගයක්ම බලන්න යන්නෙ? අඩුම ගානේ මේ ප්‍රසංග දෙකක් අතර කාලය මාස දෙකක්වත් දුරස් කරන්නෙ නැත්තෙ ඇයි? අනෙක් අතින් දැන් ප්‍රසංග වල මිලත් ඉහළයි. මේක පවුලකට දරන්න පුලුවන් මිලක් නෙවෙයි. කෙනෙකුට කියන්න පුලුවන් තෝරා බේරාගෙන බලන්න කියලා. ඒත් අපි එහෙම තෝරා බේරාගෙන බලන්න ගියොත් මේ ප්‍රසංග වලට මිනිස්සු නැතිවේවි. අපි තමයි බැන බැන හරි හැමදාම මේවා බලන්න යන කට්ටිය.



ඉතින් පොඩ්ඩක් අපි ගැනත් හිතන්න.

## එක්සත් ජාතීන්ගේ වෙසක් දිනය



මෙල්බන් නගරයේ පැවැත්වුණ එක්සත් ජාතීනගේ වෙසක් දිනය දා ගත් සේයා රූ වලින් එකක් මට පෙන්නුවෙ සන්නස සංස්කාරක අසෝක අයියා. ඒක මගේ හිතට තදින් වැදුණා. ජේසු ස්වාමිදරුවන්ගේ පිළිරුවක් යටින් යන වෙසක් පැරහැර. අපි හැමෝම ජාති ආගම් බේධ අතැරලා එක්වෙන්න ඕනෙ කාලයයි මේ. මේක යූ ඩී පෙරේරා අයියා ගත්ත සේයා රුවක් කියලා දැනගත්තා.

චූටි මල්ලි